# 10 ශ්‍රේණිය
# පුරවැසි අධ්‍යාපනය
# 05

## ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක ගැටුම් නිරාකරණය

### හැඳින්වීම

සමාජය පුද්ගලයන් සමූහයකින් සමන්විත වේ. ඔවුහු විවිධාකාරයට එකිනෙකාගෙන් වෙනස් වෙති. ඔවුන් දරන අදහස්, මතවාද විශ්වාස,උගත් නුගත්කම්, දුප්පත් පොහොසත්කම් ආදී විවිධ හේතු නිසා ගැටුම් ඇති වීම ද නිරතුරුවම සිදුවේ.එබැවින් මිනිසුන් තුළ පවත්නා විවිධත්වය මත ගැටුම් නිර්මාණය වේ. මෙම විවිධත්වය භාෂාව,කුලය,ආගම,ප්‍රදේශ මුල් කරගෙන ඇතිවේ. එම විවිධත්වයේ ප්‍රතිඵල ලෙස පුද්ගලයින් තුළ, පුද්ගලයින් අතර, පුද්ගලයින් හා රාජ්‍ය අතර, රාජ්‍ය හා රාජ්‍ය අතර ගැටුම් නිර්මාණය වේ.

එවැනි ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම ජන සමාජයේ යහපැවැත්ම මෙන්ම තිරසාර සාමයක් පවත්වා ගැනීමට ද අතිශයින් වැදගත්වේ.

ගැටුම් නිර්වචනය කිරීම -

ගැටුමක් යනු "ප්‍රචණ්ඩ හැප්පීමක්, අරගලයක් හෝ හරඹයක්, මානසික වශයෙන් සිදුවන අරගලයක් " (ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය)

### ගැටුමට මුල්වන පුද්ගල මනස


ගැටුමට මූලාරම්භය වන්නේ පුද්ගල මනස තුළ ඇතිවන නොරිස්සුම්කාරී තත්ත්වයන්ය. එහි ප්‍රතිඵල ලෙස අසහනය, ආතතිය, ක්ෂණික කෝපය, නොරුස්නාකම,ප්‍රචණ්ඩ වචන භාවිතය, කලහකාරී හැසිරීම, කායික පහරදීම ආදී විවිධ චර්යාවන් සිදු කරනු ලබයි.මිනිසුන් තුළ ඇති වන්නා වූ මෙම ගැටුම්කාරී තත්ත්වයන් සමනය කර නොගතහොත් මානසික රෝගී තත්ත්ව කරාද ගොදුරු විය හැක. නොගතහොත් මානසික රෝගී තත්ත්ව කරාද ගොදුරු විය හැක.

මේ අනුව ගැටුම් ඇතිවීමට පුද්ගල මනස මුල්වන බැවින් මානසික සාමය ඇති කිරීම මඟින් ගැටුම්කාරී ස්වභාවය අවම කිරීම හෝ ඉවත් කිරීම කළ හැක.

* ආගමික වතාවත් කෙරෙහි යොමුවීම
මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්
උපදේශනය මගින්
ස්වභාවික පරිසරය නිරීක්ෂණය මඟින්

ආදි කටයුතු මගින් මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැක.

### ගැටුම ඇතිවීමට බලපාන මූලික හේතු :-





ඉහත දක්වන ජොහාන් ගැල්වුන් විසින් ඉදිරිපත් කර ඇති ත්‍රිකෝණ අරගල ගැටුම් අකෘතිය ගැටුම් පිළිබඳ අධ්‍යයනයේදී යොදාගනු ලබයි.


මෙයින් දැක්වෙන අන්දමට ගැටුම් හා සම්බන්ධ චර්යාවන් විවිධාකාර වේ. මේ බලහත්කාරී චර්යාවන් ප්‍රචණ්ඩකාරී හෝ විනාශකාරී විය හැක.

ආකල්ප ලෙස ගැටුම නිර්මාණයවීමට බලපාන පාර්ශවකරුවන් ඇති කර ගන්නා අසත්‍ය හෝ වැරදි අවබෝධය දැක්විය හැක.

සන්දර්භය ලෙස ගැටුමට මුල්වන සමාජ,ආර්ථික,දේශපාලන වාතාවරණය දැක්විය හැක.

<u>ගැටුම් ඇතිවන පාර්ශ්ව</u>




**ගැටුම් වර්ග**

(1) අභ්‍යන්තර ගැටුම්

යම් රටක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි පුද්ගල ගැටුම් හා සමාජයීය ගැටුම් අභ්‍යන්තර ගැටුම් ලෙස හඳුන්වයි.

අභ්‍යන්තර ගැටුම්

සාර්ව ගැටුම්

උදා:- ජනවර්ග අතර ගැටුම්
ආගම් අතර ගැටුම්
ජාතික වෘත්තිය සමිති අතර ගැටුම්

සූක්ෂම ගැටුම්

උදා : පුද්ගලයා තුළ ඇතිවන ගැටුම්
පුද්ගලයින් අතර ඇතිවන ගැටුම්
පවුල තුළ ඇතිවන ගැටුම්
පවුල් අතර ඇතිවන ගැටුම්

(2) අන්තර්ජාතික ගැටුම්

රටවල් අතර පවත්නා ගැටුම් අන්තර්ජාතික ගැටුම් ලෙෂ හඳුන්වයි.

අන්තර් ජාතික ගැටුම්

මතවාදී ගැටුම්

යුධමය ගැටුම්

ගැටුම් ඇතිවන මුල

(1) වාර්ගිකත්වය - කුලය
ගෝත්‍ර
මතවාද
සමාජ ස්තර

(2) දේශපාලනය - දේශ සීමා
බල ව්‍යාප්තිය

(3) සමාජ ආර්ථික තත්ත්වය - දරිද්‍රතාව
වෙළඳපොල
සම්පත්

(4) ආගමික මතවාද - නිකාය
ආගම් අතර

ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම

(1) සාකච්ඡා කිරීම

- අන්‍යෝන්‍ය සහයෝගය
- අවබෝධයෙන් කටයුතු කිරීම
- දෙපාර්ශවයේ කැප කිරීම

(2) සහ මන්ත්‍රණ සහ කේවල් කිරීම

කේවල් ක්‍රමයේ ලක්ෂණ

- කණ්ඩායම් ක්‍රියාවලියකි
- සේවක-සේව්‍ය දෙපාර්ශවයකින් යුක්ත වීම
- විධිමත් ක්‍රියාවලියකින් යුක්ත වීම

(3) මැදිහත්කරණය

මැදි හත්කරුවෙකු සතුවිය යුතු ගුණාංග

- දෙපාර්ශවයම පිළිගත හැකි කෙනෙකු වීම
- ගැටුම පිළිබඳ හොඳ අවබෝධයක් තිබීම
- දෙපාර්ශවයටම බලපෑම් නොකරන්නෙකු වීම

(4) සමථකරණය

සමථකරුවෙකු සතු වියයුතු ගුණාංග

- ඉවසිලිමත්ව ඇහුම්කන් දෙන්නෙකු වීම
- විශ්වාසවන්ත අයෙකු වීම
- සමථකරණයට ඇප කැප වූවකු වීම

(5) විනිසීම


විනිසීමේ ක්‍රියාවලියේ ලක්ෂණ

- නීතියේ ප්‍රතිපාදන අනුව තීරණය දීම
- විත්තිකරු අධිකරණයෙහි පෙනි සිටීම
- අභියාචනා කිරීමේ හැකියාව

(6) උපදේශනය

පුද්ගල ගැටුම් මෙන්ම දෙපාර්ශවයක් අතර පවතින ගැටුම් වලදී තෙවන පාර්ශවයක් විසින් විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මග පෙන්වීම් ලබාදෙමින් ගැටුම් නිරාකරණයට යොමුවීම උපදේශනයයි.

ගැටුම් සුහවාදීව නිරාකරණය කර ගැනීම සඳහා පුරවැසියෙකු සතු වියයුතු ගුණාංග.



ගැටුම් සාමකාමීව විසදා ගැනීමේ වාසි

- සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වීම
- ජීවිත හානි වැලකීම
- දේපළ හානි වැලකීම
- සම්පත් නාස්ති නොවීම
- මානසික ආතතිය අවම වීම

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

(1) ගැටුමක් යනු කුමක්දැයි නිර්වචනයක් මගින් ඉදිරිපත් කරන්න.

(2) ගැටුම් වර්ග 2 ක නම් කරන්න.

(3) ගැටුම් ඇතිවන පාර්ශව 3 ක් ලියන්න.

(4) අන්තර්ජාතික ගැටුම් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. ඒ මොනවාද

(5) අන්තර් ජාතික ගැටුම් යනු මොනවාද හඳුන්වන්න.

(6) ජොහාන් ගැල්ටුන්ගේ " ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය" ඇසුරෙන් ගැටුම් ඇතිවීමට බලපාන මූලික හේතු පැහැදිලි කරන්න.

(7) ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු සතුවිය යුතු ගුණාංග 3 ක් ලියන්න.

(8) ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි 5 ක් ලියන්න.

(9) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 3 ක් ලියන්න.

(10) උපදේශනය යනු කුමක්ද?

(11) සමථකරුවෙකු සතුවියයුතු ගුණාංග 3 ක් ලියන්න.

(12) විනිසීම ක්‍රියාවලියේ ලක්ෂණ 2 ක් ලියන්න.

ඩබ්.ලිව්.අයි.කේ.කරුණාරත්න

කෑ/දෙහි/යටි/ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා ම.ම.වි.